# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 18 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථ සාධක සංගම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අප්‍රේල් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අප්‍රේල් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : ශත 20 යි	තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 18 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 අප්‍රේල් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 8/80

**රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 18 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 54 දරන පනතින් අවසන් වරට සංශෝධිත, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— 283 වන අධිකාරියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) කිසිම සාමාජිකයකු විසින් අනුගාමී වර්ෂ තුනකට වැඩි කාලයක් ධුරය දැරීම නොකළ යුතුය. තවද, සේව යෙහි යෙදී සිටින්නේ නම් එක් එක් සාමාජිකයා කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත සේවා ස්ථාන ගත කරනු ලැබ සිටින නිලධරයකු විය යුතු ය යන අතුරු වගන්තියට යටත්ව එක් වර්ෂයකට වරක්, වාර්ෂික මහා සභාරැස්වීමේදී තෝරා පත්කර ගනු ලබන සංස්ථාවේ සාමාජිකයන් එකොළොස් දෙනකුගෙන් ද".

3. 1966 අංක 15 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 54 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදයේ (iv) වන අනුඡේදය වෙනුවට, පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(iv) කාර්යාලයට හා කාර්යාලයේ සිට යාම් ඊම් සඳහා තම දෛනික ගමන් පහසුව පිණිස බයිසිකල් සහ මෝටර් බයිසිකල් මිලට ගැනීම සඳහා:

එසේ වුව ද තනි සේවා නියුක්තයකු සම්බන්ධයෙන් වූ විට, එසේ දෙනු ලබන මුදල භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද මුදල හෝ වාහනයේ මිල යන දෙකින් අඩු මුදල නොඉක්මවිය යුතු ය; සහ".

2- 69567—8,125 (83/05)

[illegible]

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව, එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.